**දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර 04- 2017**

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර 04 හි 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලද අතරශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන අපනයන ආනයන බැංකුව අතර 2014 සැප්තැම්බර් 16 සහ 2017 දෙසැම්බර් 22 දින එළඹි අංක ජීසීඑල් අංක (2014) 18 එකතු අංක (521) සහ ජීසීඑල් අංක (2015) 27 එකතු අංක (566) දරන ණය ගිවිසුම් යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ, දැනටමත් ක්‍රියාත්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය (කොළඹ සිට මාතර) මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කිරීමෙන් වාණිජ නගරය (කොළඹ) සහ අලුතින් ඉදිකරන ලද වරාය (හම්බන්තොට) සහ ජාත්‍යන්තර ගුවන්තොටුපොල (මත්තල) අතර සම්බන්ධතාවයක් ඇති කිරීමයි. ව්‍යාපෘතියේ අදියර 04 යටතේ අන්දරවැව හරහා මත්තල සිට හම්බන්තොට දක්වා කිලෝමීටර් 25 ක් දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 55,965 ක් වන අතර ඉන් සිවිල් කොන්ත්‍රාත් වැඩ සහ උපදේශන සේවා සඳහා රු.මිලියන 55,615 කට සමාන එ.ජ.ඩො. මිලියන 435 ක් සැපයීමට චීන අපනයන ආනයන බැංකුව එකඟවී තිබුණි. රු.මිලියන 350 ක් වන ඉතිරි මුදල ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කිරීමට අපේක්ෂිත වේ. ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ 2016 ජනවාරි 19 දින ආරම්භ කරන ලද අතර 2019 ජනවාරි 19 වන විට නිමකිරීමට සැලසුම් කර තිබූ අතර පසුව 2019 ජූලි 09 දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්

ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්,මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලටඅනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව හා මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි සඳහන් කරුණුවලින් උද්ගත වන ගැලපීම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

**(අ)** 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව, සහ

**(ආ)** සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ උපදේශන සේවා සඳහා ණය ගිවිසුම ශ්‍රී ලංකා රජය සහ චීන අපනයන ආනයන බැංකුව අතර 2017 දෙසැම්බර් 22 දින රු.මිලියන 3,458 කට අත්සන් කර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල එම තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ සිවිල් වැඩ උපදේශකවරයා 2015 සැප්තැම්බර් සිට වැඩ ආරම්භ කර කටයුතු කරගෙන ගොස් ඇත. කෙසේවුවද, උපදේශන කටයුතු මත ඇතිවන අනාගත වගකීම, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 නීතිරීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් කරන ලදී.

| අංකය | නීතිරීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 5.4.4(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් රු.මිලියන 10,431 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කෙසේවුවද, යතුරුලියන දෝෂයක් හේතුවෙන් අත්තිකාරම් ගණනය කිරීමේදී ප්‍රමාණපත්‍රවල තාවකාලික එකතු වටිනාකම් සහ අවිනිශ්චිතතාවන් බැහැර නොකිරීම නිසා රු.මිලියන 3,187 ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි. |
| (ආ) | කොන්ත්‍රාත් ගිවිසුමේ විශේෂ කොන්දේසිවල 14.6 උපවගන්තිය | කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අන්තර්ගෙවීම් සහතිකයක අවම අගය, කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1 ක් වේ. |

කෙසේවුවද, ඇගයීමේදී අවශ්‍ය අගයට වඩා පහළ අන්තර්ගෙවීම් සහතික තිබූ අවස්ථා 03 ක් නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුල සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | 2017 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | | | | 2017 වර්ෂය තුල | 2017 දෙසැම්බර් 31 දිනට |
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| චීන අපනයන හා ආනයන බැංකුව - සිවිල්වැඩ | 412.0 | 52,156 | 15,085 | 15,081 | 23,742 |
| චීන අපනයන හා ආනයන බැංකුව - උපදේශනය | 22.9 | 3,458 | - | - | - |
| ශ්‍රී ලංකා රජය (ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ඉඩම් අත්පත් කර ගැනීම්) | - | 350 | 116 | 116 | 156 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | - | - | - | 5 | 31 |
| සම්පත් බැංකුව | - | - | - | 37 | 37 |
| එකතුව | 434.9 | 55,964 | 15,201 | 15,239 | 23,966 |

### 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සිවිල් වැඩ සහ ඉඩම් අත්පත් කරගැනීමේ අපේක්ෂිත භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 70 ක් සහ සියයට 62 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 62 ක් සහ සියයට 49 ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන තිබුණි. එමනිසා, ව්‍යාපෘතිය අපේක්ෂිත ඉලක්කවලට සුළු වශයෙන් පිටුපසින් විය.

(ආ) ව්‍යාපෘතිය 2019 ජූලි 09 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවුවද, 2018 සැප්තැම්බර් 30 දිනට ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව, සියයට 96 ක් වූ අපේක්ෂිත ප්‍රගතියට එරෙහිව අත්කරගත් ප්‍රගතිය සියයට 81 ක් විය. එමනිසා ඉලක්කගත දිනයට ව්‍යාපෘතිය නිමකිරීම අවිනිශ්චිත වේ.

**3.3 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්යසාධන බැඳුම්කර අදාල කොන්ත්‍රාත්කරුගේ පිරිවැයට ලබාගැනීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසිවල 4.2 උපවගන්තිය යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට පටහැනිව කොන්ත්‍රාත්කරුවන්ට කාර්යසාධන බැඳුම්කර සපයාගැනීමේ පිරිවැය දැක්වීමට ඉඩදීම සඳහා වෙනම ගෙවීම් අයිතම ප්‍රමාණ පත්‍රවල නිර්මාණය කර තිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත්කරුවන් ලබාගෙන ඇති කාර්යසාධන බැඳුම්කරවල පිරිවැය ප්‍රතිපූර්ණය කිරීම සඳහා රු.මිලියන 11.64 ක් කොන්ත්‍රාත්කරුවන්ට අතිරේකව ගෙවා තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරු විසින් දෛනික වැඩ සටහන් ඉදිරිපත් කර තිබුණද, වගකිව යුතු නිළධාරීන්ගේ දුර්වල සමීප අධීක්ෂණය හේතුවෙන්, කාලපරිච්ඡේදය පුරාවට එවැනි වැඩසටහන්වලට අනුකූලව ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණි. තවද, ව්‍යාපෘතිය නිමකිරීම සඳහා ප්‍රධාන අවශ්‍යතාවයක් වන ගාස්තු පද්ධතිය ඉදිකිරීම සහ ස්ථාපනය කිරීම, 2018 ඔක්තෝම්බර් 12 වන දින සිදුකරන ලද භෞතික පරීක්ෂාව දක්වාම නිර්මාණය කර ආරම්භ කර නොතිබුණි.

(ඇ) විස්තරාත්මක අනුරේඛනය පිළියෙල කිරීම 2014 ඔක්තෝම්බර් 23 දින ආරම්භ කර තිබුණද, දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - අදියර 4 මාර්ග පථයෙහි නීතිවිරෝධී කැනීම් තහනම් කිරීමට සේවායෝජකයා හෝ ව්‍යාපෘතිය විසින් පියවර ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉඩම පිරවීම සඳහා රු.මිලියන 386.6 ක අමතර මුදලක් ව්‍යාපෘතිය විසින් දරා තිබුණි.

(ඈ) සමාජීය, පාරිසරික, අනුකූලතා සහ ඉඩම් අත්පත් කරගැනීම පිළිබඳ උපදේශක තනතුර, ව්‍යාපෘතියේ අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් කර නොතිබුණි. කෙසේවුවද, එම තනතුරු සඳහා ප්‍රමාණ පත්‍ර අයිතම 109(1) මගින් රු.මිලියන 1.32 ක වැටුප් සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණි.